# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

## බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## රැකියා පුරප්පාඩු

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දිවයින පුරා පවතින පුරාවිද්‍යා ස්ථානවල දැනට පුරප්පාඩුව පවතින ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) පුරාවිද්‍යා සහායක III/මුරකරු III තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | විවෘත පදනම මත පවතින පුරප්පාඩු |
|---|---|
| (i). පුරාවිද්‍යා සහායක III | 191 |
| (ii). මුරකරු III | 324 |

02. වැටුප් පරිමාණය - 2025.03.25 දින සිට අනුමත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව PL-01-2025ට අනුකූලව රු. 40,000-10X450-10X490-10X540-12X590-61,880/- වැටුප් පරිමාණය වේ.

03. අධ්‍යාපන සුදුසුකම් - අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06)කින් සමත් වී තිබීම.

වෘත්තීය සුදුසුකම් - අදාළ ක්ෂේත්‍රය තුළ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

පළපුරුද්ද - අදාළ ක්ෂේත්‍රය තුළ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

වයස - අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු
උපරිම සීමාව : අවුරුදු 45ට නොවැඩි

- **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට ඉහත සුදුසුකම් සියල්ල සම්පූර්ණ කර තිබිය යුතුය.**

වෙනත්
i. පසුගිය වසර 05 ඇතුළත පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ග්‍රාම නිලධාරී සහතිකයක් මගින් සනාථකළ යුතුය.)
ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සුදුසුකම් අයදුම්පත් කැඳවීම් නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

04. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ අයදුම්කරුවන්ට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ www.archaeology.gov.lk වෙබ් අඩවියට 2026.06.05 දිනෙන් පසුව පිවිස වැඩිදුර තොරතුරු හා ආදර්ශ අයදුම්පත්‍රය බාගත කර ගත හැකි අතර, නිවැරදි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2026.07.06 දින දක්වා පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් යොමු කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

05. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අවසන් දින පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් නුසුදුසුකමක් ලෙස සලකනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ. අයදුම්පත් යොමු කිරීමේදී ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි **"පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) පුරාවිද්‍යා සහායක III/මුරකරු III තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026"** ලෙස සඳහන් කළ යුතුය.

**පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්,**
**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. අංක 532,**
**ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.**

tamilguru.lk